ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

අංක 07, ග්‍රෙගරි පාර, කොළඹ 07.
இல 7, கிரெகரீஸ் வீதி, கொழும்பு 07
No 07 Gregory's Avenue

ෆැක්ස් / தொலைநகல் / Fax – 2684051
ඊමේල් / மின்னஞ்சல் / E-mail – Landcom@sltnet

මගේ අංකය / எனது இல / MY NO: ආර්.කේ.23(iv)
ඔබේ අංකය / உமது இல / YOUR:
දිනය / திகதி / DATE: 2008.10. 22

චක්‍රලේඛ අංක:- 2008/7

සියළුම පලාත් ඉඩම් කොමසාරිස් වරුන්.

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන අවසර පත්‍ර (ඉ.කො. 144) සඳහා භාවිතා කරන මුද්‍රිත ආකෘතිය අවලංගු කිරීම**

දිවයිනේ විවිධ ප්‍රදේශ වල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන අවසර පත්‍ර ව්‍යාජ ලෙස නිකුත් කර ඇ[ති] බවට තොරතුරු වාර්තා වී ඇත. ඇතැම් අවසර පත්‍ර ඡායා පිටපත් කළ ආකෘති වල නිකුත් කිරීමද සිදුවන බව පෙනේ. [මේ] නිසා දිවයින තුල රජයේ ඉඩම් සඳහා ව්‍යාජ බලපත්‍ර නිකුත් වීමේ අවධානමක් ඇති විය හැකි බැවින් වහාම ක්‍රියාත්මක වන පරි[දි] දැනට භාවිතයේ ඇති ඉ.කො. 144 දරණ ආකෘතිය අවලංගු කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව අවසර පත්‍රයක් ඉ.කො. 144 ඒ අංකයෙන් ආරක්ෂිත කඩදාසියක රහ[ස්‍ය] සංකේත භාවිතා කරමින් මුද්‍රණය කර ඇති අතර මෙම ආකෘති අංකගත පොත් නිකුත් කිරීම විධිමත් වැඩ පිළිවෙලක් යට[තේ] පමණක් සිදු කිරීමටද තීරණය කර ඇත. මේ අනුව ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් වරුන්ට තම කොට්ඨාශය තුල ඉඩම් සංවර්ධ[න] ආඥා පනත යටතේ බෙදා දෙන ඉඩම් ලාභීන්ට බලපත්‍ර නිකුත් කිරීම අවශ්‍ය වන විට ඉඩම් කච්චේරියේ අවසන් තේරීම් ලැයිස්[තුව] හෝ 20 (අ) වගන්තිය යටතේ අනුමැතිය දුන් අවසන් නාමලේඛනය ඔබ වෙත එවා අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව ඉල්ලා සිටිය යු[තු] අතර ඔබගේ නිර්දේශය අනුව අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව පමණක් මුද්‍රා තැබීමට කටයුතු කරනු ලැබේ. සෑම බලපත්‍රයක්ම අං[ක] පිළිවෙලක් යටතේ පිටපතක් සහිතව මුද්‍රණය කර ඇති අතර එම අංක පිළිවෙල මෙම කාර්යාලයේ සටහන් කරගනු ලැ[බේ]. කාරුණාකර මේ අනුව ඔබට අවශ්‍ය ඇණවුම අදාල නාම ලේඛන සමඟ මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණි[කව] දන්වා සිටිමි.

මේ සමඟ ඔබගේ කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල දැනට ගබඩා කර ඇති ඉ.කො.144 ආකෘති [...] වහාම විනාශ කර දැමීමට උපදෙස් ලබාදෙන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස.
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-
1 ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, — දැ.ගැ.ස.
2 සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත: — ඔබට අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ ඉල්ලීම ඉඩම් කච්චේරි අවසන් නාම ලේඛනය හෝ 20 අ අනුමැතිය දුන් නාම ලේඛනය ස[මඟ] අදාල පලාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලෙස කාරු[ණිකව] දන්වා සිටිමි.
3 නි.ඉ.කො./ස.ඉ.කො.(අන්තර් පලාත්) — ඔබට අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව ඉඩම් කච්චේරි අවසන් නාම ලේඛනය [හෝ] 20 අ අනුමත ලේඛනය සමඟ මා වෙත යොමුකර අවශ්‍ය බලපත්‍ර ගැනීමට කරුණාකර කටයුතු කරනන.
4 ඉ. කො. (ඉඩම්)/ඉ කො. (සං) /නි.ඉ.කො.(රත්බිම)/ ස.ඉ.කො.(භිනි) — අවශ්‍ය කටයුතු සඳහා.

මගේ අංකය ..........................................

ඔබේ අංකය ..........................................

..........................................................

..........................................................

..........................................................

<u>අවසරපත්‍ර ලබා දීමට ඉ.කො. 144 A ආකෘති පත්‍ර ලබා ගැනීම.</u>

මගේ සමාංක ..........................................................හා .......................................... දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් පහත නම් සඳහන් තැනැත්තන් සඳහා ඉ.සං.ආ. පනත යටතේ 20 "අ" අනුමැතිය/ඉඩම් කච්චේරි මඟින් තෝරාගත් නාම ලේඛනයට අනුමැතිය ලබා දී ඇත. (එකී අනුමැතිය සහිත නාම ලේඛනයේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි)

03. එම තැනැත්තන් වෙත අවසර පත්‍ර ලබාදීම සඳහා ඉ.කො. 144 A ආකෘති පත්‍ර .......................................... ප්‍රමාණයක් ..........................................................................නිලධාරී/නිලධාරිණිය වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.(මෙය පිටපත් 02 කින් ඉදිරිපත් කරමි)

| අනු අංකය | නම | ග්‍රා.නි.වසම | ආකෘතිපත්‍ර අංකය |
|---|---|---|---|
| | | | |

..........................................

ප්‍රාදේශීය ලේකම්

සැ.යු. - ආකෘති පත්‍ර අංක පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් අංකනය කරනු ලැබේ.